

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

**අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමි උපත් සියවස් සමරු කලබ**

| | | |
|---|---|---|
| **56 වන කාණ්ඩය** | **බු.ව. 2556 ඇසළ මස පුරපසළොස්වක දා ක්‍රි.ව. 2013 ජූලි මස 22 වන දා** | **03 වන කලබ** |

# බොදු ළමා පිළිවෙත

කාටත් මම් කරදරයෙක් නො වම් වා
කුලුණින් දෙන ඔවා බස් පිළිගනිම් වා
පරදෙස් නොව පර ගුණය ම සොයම් වා
දිවිහිම්යෙන් දුම් මත් පැන් නො බොම් වා

ඉතා පිරිසුදු ව මම නිතොර ම වෙසෙමී
වීර ගුණෙන් වැජඹෙන්නට තැත් කෙරෙමී
දිනෙන් දින ම පින්කම් කොට පොත ලියමී
පුරා මෙ ගුණ හොඳ 'බොදු ළමයෙක්' ම වෙමී

**- අතිපූජ්‍ය නාරද මාහිමියන් වහන්සේ**



ධම්මානුපස්සනා - 01

# සිත පිරිසිදු කර ගැනීම

**අතිපූජ්‍ය නාරද මාහිමිපාණන් වහන්සේ විසිනි**

සිතානු යි, එනම් අරමුණු දැනගනීනු යි හෙවත් අරමුණ ඇතුළට ගනීනු යි චිත්ත හෙවත් සිත නමි. සිත වූ කලී මිනිසාගේ ප්‍රධාන අංගය වේ. සිත උසස්ව පවතින හෙයින් මිනිසාට ''මනුස්ස'' යයි පාලි භාෂායෙන් කියනු ලැබේ.

සංස්කෘත භාෂානුකූලව මනු නම් සෘෂිවරයාගෙන් පැවැතෙන අය යන අරුතින් ''මනුෂ්‍ය'' නමි. මනුගෙන් පසු මිනිසා ශීලාචාර වූ හෙයින් එසේ කියනු ලැබේ.

මිනිස් තිරිසන් දෙපසට ම සිත ඇති නමුත් තිරිසනාට වඩා සිතීමේ ශක්තිය මිනිසාට තිබේ. මේ දෙපසට ම ප්‍රේමය හා ක්‍රෝධය ද ඇත්තේ ය. තිරිසනා ගේ ප්‍රේමය ආත්මදමනය, ආත්මගෞරවය, ශීලාචාරකම, භය, ලජ්ජා ආදී උතුම් ගුණධර්මයන්ගෙන් තොරවූ හෙයින් එය ඉතාම භය ජනක සිද්ධින්ගෙන් යුක්ත ය.

සිතීම පිළිබඳ විශේෂ ශක්තියක් ඇති මනුෂ්‍යයා ද, ප්‍රේමයෙන් අන්ධ ව හුදු ආලයෙන් ම හොඳ නරක නොදැන ක්‍රියා කළහොත් ඔහුගේත් තිරිසනාගේත් වෙනසක් ඇති නොවෙයි. එබඳු මිනිස් තෙමේත් තිරිසන් ගති ඇත්තෙක් වේ. ක්‍රෝධය ද මෙසේ ම ය. බල්ලාට ක්‍රෝධය ඇති විට, පසු

පස එළවීම, හැපීම, බිරීම, පලිගැනීම උගේ ගතියකි. සිතීමේ ශක්තිය ඇති මිනිසා ක්‍රෝධයට ඉඩ නොදී එය යටපත් කිරීමට උත්සාහ දරයි. එසේ නැතිව ක්‍රෝධයට ඉඩ දුන්නොත් හේ ද තිරිසන් ගති ඇත්තෙක් වේ. ප්‍රේමය හා ක්‍රෝධය මැඩීමේ ශක්තියක් මනුෂ්‍යයාට නිසර්ගයෙන් ම පිහිටි නිසා සිතේ බලයෙන් නිරතුරු එවා මැඩ පැවැත්විය යුත්තේ ම ය. සිත හා රූපය  යන මේ දෙකින් මනුෂ්‍යයා යුක්ත නමුත් රූපයට වඩා ඉමහත් බලයක් සිතෙහි පවතී.

රූපය ධාතුවලින් යුක්තයි. රූපයෙහි නොබෙදිය හැකි ‘පරමාණු’’ තිබේ. යන මතයක් යුරෝපයේ හා ඉන්දියාවේ පණ්ඩිතයන් අතර ඇති විය. එහෙත් ධර්මානුකූලව නොබෙදිය හැකි පරමාණුවක් නැත.

ජනේලයෙන් ගෙතුළට වැටෙන ආලෝකයෙහි පෙනෙන දූවිලිවලට රථරේණු යි කියනු ලැබේ. ඒ රථරේණුවකින් තිස්හයෙන් කොටසට ‘‘තජ්ජාරි’’ යයි ද තජ්ජාරියකින් තිස් හයෙන් කොටස ‘‘අණු’’ යයි ද අණුවකින් තිස්හයෙන් කොටස ‘‘පරමාණු’’ ය යි ද ව්‍යවහෘතයි.

පරමාණු ද බෙදිය හැකිය. මෙහි පරමාර්ථ හෙවත් නොබෙදිය හැකි අන්තිම දේවල් වශයෙන් පඨවි, ආපෝ, තෙජෝ, වායෝ, වෙත්, වර්ණ ගන්ධ, රස ඕජා යන මෙයින් යුක්තයි පඨවි යනු මෘදු හෝ තද ගති ය යි. ආපෝ යනු වැගිරෙන ගතිය යි. තෙජෝ යනු ශීත හා උෂ්ණ ගති යයි. වායෝ යනු පුම්බවන සෙලවන බන්ධන  ගතිය යි.

යුරෝපයේ පඬිවරු මිනිසාගේ ශ්‍රේෂ්ඨ වස්තුව වූ සිත ගැන නොසොයා පළමුවෙන් චන්ද්‍ර, සූර්ය, තාරකා ආදී බාහිර වස්තූන්ගේ ස්වභාවය දන ගැනීමට උත්සාහ දරූහ. පිරික්සීමට පටන් ගත්තේ ඊයේ රෑත් නොව අද උදේය කියන තරමට මෑතදී ය. ආසියාතික පඬුවෝ එසේ නොවෙති. සිත පළමුවෙන්

පිරික්සා සිතේ තත්ත්වය හරිහැටියට දැන ගෙන අනුනට ද අවබෝධ කර දුන්හ. සිත පිළිබඳ විස්තරයක් බුද්ධාගමයේ මෙන් වෙන කිසි ආගමක උගන්වා නැත. අනෙක් ආගම්වල මෙන් බුද්ධාගමේ ආත්ම වශයෙන් ගත යුතු කිසිවකුත් නැත. එහෙයින් ''අනාත්ම ධර්මය'' බුද්ධාගමේ විශේෂ අංගයෙකි.

මෙහි ආත්ම වශයෙන් ගත යුතු, නො පෙරළෙන සුලු ස්ථිර දෙයක් නැත. මොහොතක් පාසා වෙනස් වෙමින් පවතින නිරතුරු ගලායන්නා වූ චිත්තසන්තතියක් හෙවත් සිත් පරම්පරාවක් අපට ඇත. යම් තැනකට පළමු වර ගසන විට පැවැති කාලය වත් ඒ ගැසූ ඇඟිල්ල වත්, මේසය වත් නො වේ. දෙවන පාර ගසන විට ඒ තුනම වෙනස් විය. කාලයත් මුල් කාලය නොවේ. එය ගෙවී ගියේ ය. ඇඟිල්ල ද ක්ෂණික වශයෙන් ම වෙනස් විය. මේසය ද දිරීම් ආදී වශයෙන් වෙනස් වීමට පත්විය. එසේ හෙයින් මේ සියල්ලක් ම ගලා යන්නා සේ දිගින් දිගට ම වෙනස් වේ.



සරත් කාලයෙහි හටගත් කුමුදු මලක් අතින්
කඩන්නාක් මෙන් තමාගේ තෘෂ්ණාව සිඳ දමව.
නිර්වාණ මාර්ගය වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම
වඩව. (කුමක් නිසා ද යත්) නිර්වාණය සුගතයන්
වහන්සේ විසින් ශාන්තය, ප්‍රණීතය යනා දී වශයෙන්
දේශනා කරන ලද හෙයිනි.

(ධම්මපදය - මාර්ග වර්ගය)



# කක්කාරු ජාතකය

**අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ**
**මහානායක මා හිමිපාණන් වහන්සේ විසිනි**

නැති ගුණ පෙන්වා රට රවටන්නෝ කවදත් දුලබ නො වෙති. මෙකලැ මෙන් ම බුදුන් වහන්සේ දවස ද එබන්දෝ විරල නො වූහ. දිනක් දෙව්දත් තෙරණුවෝ බුදුන් වහන්සේ වෙත එළැඹ ''හිමියෙනි, සියලු භික්ෂූහු දිවි ඇති තෙක් ම අරණ්‍යවාසීහු වෙත්වා! පිණ්ඩපාතිකයෝ වෙත්වා ! වෘක්ෂමූලිකයෝ වෙත් වා ! පංශුකූලිකයෝ වෙත් වා ! මත්ස්‍ය මාංසයෙන් වැළැකුණෝ වෙත් වා !'' යි සිකපද පනවන ලෙස අයැදූහ. ඔහු අසර්වඥ බැවින් මේ පස් වරයන් ඉල්ලූ නමුත් සර්වඥ වූ බුදුන් වහන්සේ ලොවැ නො පැවැත්විය හැකි අණ දීම් තමනට තරම් නො වන බැවින් ඒ පස් වරය ම ප්‍රතික්ෂෙප කළහ. තමන් අභිමතාර්ථය සිද්ධ නොවීමෙන් කිපුණු අඥ වූ දෙව්දත් තෙරණුවෝ සංඝයා භේද කෙරෙමින් එබඳු ම වූ භික්ෂූන් පිරිසක් කැඳවා ගෙන අන් තැනකට පලා ගියහ.

බුදුන් වහන්සේ රජගහ නුවර වෙළුවනාරාමයෙහි වැඩ වෙසෙන දිනෙකැ දම්සබාවට රැස්වූ භික්ෂූන් මේ පුවත ගැන දොඩන්නට වූහ. '' අහෝ ! බොරුවෙන් ලොව මුළා කළ දෙව්දත් තෙරුනට වූ විපතක සැටි, ඔහු මුසවා කොට සංඝයා භේද කොට රැගෙන ගිය මහණ මුළුව අගසව්වන්

සමඟ නැවැත ආයෙන් තමනට වූ පරිහාණිය ගැන සිතත් ම මුවින් උණු ලේ වැගිරිණ අනේ ! දෙව්දත්තයා දැන් ගිලන් වැ මහදුක් විඳී ල''

මෙසේ දොඩමින් සිටි මහණ මුළුවට වැඩම කළ බුදුන් වහන්සේ 'මහණෙනි, මා එන්නට පෙර කිනම් කථාවෙකින් යුක්ත වැ ''හුන්නහු ද'යි ඇසූහ. එබසට පිළිතුරු දෙන භික්ෂූහු ''ස්වාමීනි අපි දෙව්දත්නට වූ විපත ගැන දොඩමින් සිටියෝ වෙමු'යි පැවසූහ. ''මහණෙනි, දෙව්දත්හු මුසාව කොට දුක් වින්දො දැන් නො වැ පෙරත් වින්දහ''යි මේ ඉකුත් වත ගොත හැරැ දැක්වූහ.

බොහෝ කලකට පෙර බඹදත් රජු රජකරවන සමයෙහි අප බෝසත්හු  තවුතිසායෙහි දෙව්පුතෙක් වැ උපන.

එසමයෙහි බරණැස් පුරැ මහ උත්සවයක් විය. බොහෝ නාග සුපර්ණයෝත් බූමාටු දෙවියෝත් පැමිණ උත්සව බැලූහ. තවුතිසා වැසි සතර දෙව් පුත් කෙනෙක් ද කක්කාරු නම් දිව්‍යපුෂ්පයන් ගොමු කොට හිසැ පැළැඳැ උත්සව බලනට ආහ. ඒ මනරම් කකුරු මලින් දෙළොස් යොදුන් පමණ වූ මුළු බරණැස එක ම සුවඳ කැටියක් වැනි වීය. මේ සුවඳින් වියරු හුණු මිනිස්සු මෙතෙක් සුවඳැති මල් පැළැන්දෝ කවරහුදැ යි සොයන්නට වූහ. මේ බව දත් සතර දෙව්පුත්හු රජ මිදුල මතුයෙහි මහත් ආනුභාවයෙන් පහළ වූහ. පුදුමයට පත් රජ රජමැතියෝ ද, සිටු යුවරාජාදීහු ද, සෙසු මහජනයෝ ද රජ මිදුලට ම රැස්වූහ. පෙර නො දුටු විරූ අමුත්තන්ගේ දර්ශනයෙන් කැළැඹුණු මහා ජනයෝ ඇසුත් කටත් හයා උඩ බලාගෙන සිටි වන ම සිට ''ස්වාමීනි, ඔබ කොයි සිට ආවාහු දැ''යි ඇසූහ. ''අපි තව්තිසා දෙව්ලොව සිට ආවෙමු'යි පිළිතුරු දුන්හ. ''කුමට ආවාහු ද?'' උත්සව බලනු සඳහා''යයි කීහ. මෙසේ පිළිසඳරින් යහළු වූ මහාජනයෝ මල් සුඹුලු යැදූහ. මේ

කකුරු දිව මල් ය. එහෙයින් මහානුභාව ඇති දෙවියනට ම සුදුසු ය. මිනිස් ලොවැ ලාමක වූ අප්‍රාඥ වූ හීනාධිමුක්තික වූ දුශ්ශීලයනට සුදුසු නොවේ. ඉදින් මිනිස් ලොව යම් කෙනෙක් මෙකී ගුණයෙන් යුක්ත වෙත් නම් ඔවුනට මේ මල් සුදුසු යැයි පවසමින් දෙටු දෙව්පුත් මෙසේ ද කීහ.

''නිදුකාණෙනි, යමෙක් අන් සතු තෘණශලාකමාත්‍රයකුදු (තණ කූරක් පමණකුදු) ඇර නො ගනී ද? දිවි යතුදු මුසවා නො කෙරේ ද? හෙවත් කය - වචනය - මනස යන තුන් දෙරින් දශ අකුශලයන් නො කෙරේ ද? දශ කුශලයන්හි ම යෙදී වෙසේ ද? එසේ ම ධනධාන්‍ය කීර්ති ප්‍රශංසා ගරු බුහුමන් ලදින් කුල්මත් නො වැ, නො උදම් අප්‍රමාද වැ ගුණදම් පුරමින් ම වෙසේ ද? හේ මේ කකුරු මල් පළඳනට සුදුසු යැ, එබන්දකු ඉල්លුව හොත් මේ මල් සුඹුළුව දෙමැ යි කී ය.

(මෙතෙක් ගුණ නිමල වැ නැතත් යම්තම් වත් ගුණ ඇතියෝ මුසවා බියෙන් නිහඬ වූහ. ''අඩු කළය ම ගැස්සෙන්නා සේ නැති ගුණ හඟවන්නෝත් අබැටක් සා ද ඇති ගුණ මහමෙරක් සේ දක්වන්නෝත් නැති ගුණ වනන විට නිහඬ ව ඉවසන්නෝත් නිර්ගුණයෝ ම යැ. රජ මිදුලෙහි රැස් වූ මහජනයා අතර සිටි පුරොහිත බමුණා ද මෙබන්දෙකි. හේ ධනයෙන් පොහොසත් වුව ද ගුණයෙන් පුහු සතෙකි.)

එහෙයින් පුරෝහිතයා සිතනුයේ ''මා තුළ එකී ගුණ එකකුදු නොවේ. එහෙත් මා දෙඩිය හැකි කටක් ලද්දෙක්මි. ඒ නිසා මුසවා කොට මල් සුඹුලුව රැගෙන පළඳිමි. එවිට මහා ජනයා ද මා මහ ගුණවතෙකැ යි දැන ගනිතැ යි සිතමින් ස්වාමීනි, එකී ගුණ මා සතු ය. මල් සුඹුලුව මට දෙව''යි යැදී ය. දෙටු දෙව්පුත් තම මල් සුඹුළුව පුරෝහිතයාට දුන්නේ ය. තණ්හාව නම් සෑහීමකට පත් නොවන්නකි. එහෙයින් පුරොහිතයා දෙවැන්නාගේ මල් වඩම ද යැදී ය.

දෙවැනි දෙව්පුත් ද ''යමෙක් කෘෂිකර්මාදියෙකින් හෝ අන් රාජකාර්යයෙකින් හෝ ධාර්මික වැ ම වස්තු සපයා ද, වඤ්චා ශඨකපට ප්‍රයෝගයෙකින් හෝ අත්ලස් මඟින් හෝ අන්සතු වස්තුව නො ගනී ද? එසේ ම භෝගයන් ලැබ නො උඩඟු වැ නො උදම් වැ අප්‍රමාදී වැ ගුණදම් පුරමින් ම කල් යවාද හේ මැ මේ කකුරු මල් සෝළුව පළඳනට සුදුසු යැයි කීහ.

පුරොහිතයා පෙර සේ මැ බොරු කියා ඒ මල් සෝළුවත් ඉල්ලා ගෙන තෙවැන්නාගේ මල් සෝළුවත් ඉල්ලී ය.

තෙවැනි දෙව්පුත් ද ''යමෙකුගේ හිත කසායේ පැහැසේ ක්‍ෂණයෙක්හි යහපත් වැ ක්‍ෂණයෙක්හි අයහපත් වැ නො බිඳේ ද, (පත් පත් තැනට ගැළැපෙන පාට මාරු කරන්නා කටුසු ආදි තිරිසනුන් මෙනුත්, වරින් වර වෙස් මුහුණු බැඳ ගන්නා දහඅටපාලිකාරයකු මෙනුත් නො වැ) අසලවුන් කෙරෙහි ස්ථිර ප්‍රේමයෙන් යුතු වැ ම පිහිටා ද, යමෙකුගේ ශ්‍රද්ධාව අචල ද, කෙනෙකුගේ වචන මාත්‍රයකින් නො විදේ ද, මිහිරි අහරක් ලදින් පත් පත් කෙණෙහි දියයුතු මහණ බමුණනට නොදී තනියෙ මැ නො බුදී ද හේ මේ මල් පළඳනට සුදුසු යැ'යි කීහ.

පුරෝහිතයා පෙර සේ මැ බොරු කියා ඒ මල් සුඹුලුවත් ඉල්ලා ගෙන සිවු වැන්නාගේ මල් සුඹුලුවත් ඉල්ලුයේ ය.

සිව්වැනි දෙව්පුත් ද '' යමෙක් හමුවෙහි හෝ නො හමුවෙහි හෝ කලයාණ ගුණැති සත්පුරුෂයන් නො ගරහා ද, අවමන් නො කෙරේ ද, නැති අගුණ ඇද නො බාද එකක් කියමින් තවෙකක් නො කෙරේ ද, යම් සේ කියා ද එසේ ම කයිනුත් කෙරේ ද, යම්සේ කෙරේ ද එසේ මැ බසිනුත් බෙණේ ද මෙබඳු අනුන් නො ගරහන යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී තැනැත්තෙ ම කකුරු මල් පළඳනට සුදුසු යැ යි කීය.

පුරොහිතයා පෙර සේ මැ තමන් ළඟ නැති ගුණ ඇති බව කියමින් මල් සෝළුව ඉල්ලුයේ ය. දෙව්පුතු ද එය දිනි.

මෙසේ සතර දෙව්පුත්හු තමන් පැළඳ ආ මල් සෝළු සතර මැ පුරෝහිතයාට දී දෙව්ලොව බලා ගියහ. පුරෝහිතයා ද කකුරු මල් සෝළු හතර ම හිසැ පැළඳ ගති. ''කරන කලට පව් මීරිය මී සේ, විඳින කලට පව් දැඩිවිය ගිනිසේ''යි කීවාක් මෙන් බොරු කියා මල් ලබා ගත් ප්‍රීතිය තුබුණේ වැඩි වේලාවක් නොවේ. උදම්වැ මල් පළඳනුවන් සමග ම යදමින් හිස පෙළනුවක් මෙන් දැඩි වූ වේදනා දැනෙන්නට විය. ඉවැසිය ද නොහැකි විය. මහහඬ දෙමින් ඒ මේ අතැ පෙරෙළෙන්නට ද වීය. මහදෙනේ, මේ කිමෙක, මේ කිමෙකැ යි අසන්නට විය. අනේ භවත්නි, මා මේ මල් ලබා ගත්තේ බොරුවෙන් නැති ගුණ හඟවා යි, ඒ පළඳනුවන් සමඟ නො ඉවැසිය හැකි වේදනා ඇති විය. අනේ ! භවත්නි, අනේ භවත්නි, මේ මල් මා හිසින් බැහැර කරව් යයි මරහඬින් මුර ගාන්නට විය. සෝළු හරනට බොහෝ උත්සාහ කොටත් නො හැකි වැ හඬමින් සිටි උහු ඔසවා ගෙන ගොස් ගෙදර දැමී ය. මෙසේ මහ දුක් විඳිනුයේ සත් දවසක් ගත වීය.

සත් වැනි දවසැ රජු ඇමැති ගණයා රැස් කොට ''සගයෙනි, අර දුශ්ශීල බමුණා මැරෙනු නො අනුමාන ය. උහු ගළවනුවට කුමක් කරමෝදැ යි ඇසී ය. මහරජ, නැවත උත්සවයක් කරමු. එවිට දෙවිවරු නැවතත් එනවා ඇතැ යි ඇමතියෝ කීහ. රජු ද අණ බෙර ලවා නැවතත් උත්සව පැවැත් වීය. සතර දෙව්පුත්හු ද මුළු නුවර ම සුවඳ කෙරෙමින් උත්සව බලනු සඳහා පැමිණියහ. මහාජනයෝ දුසිල් බමුණා ද ගෙනවුත් දෙව්පුතුන් ඉදිරියෙහි තැබූහ. බමුණා ද ''ස්වාමීනි, සමා වී මා දිවි දෙව''යි යැදී ය.

දෙව්පුත් ද ''මේ මල් දුශ්ශීල නිර්ගුණයනට සුදුසු නොවේ. තා දුශ්ශීල නිර්ගුණ වැ සිට ගුණවතැ සිල්වතැ යි මහ ජනයා රවටන අදහසින් මුසවා කොට වඤ්චායෙන් මල් ගත්තෙහි. එහි විපාක තා මැ වින්දෙහි'යී මහජනයා මැද්දෙහි ඉමහත්

ලෙස ගර්හා කොට මල් සෝළුව ඔහු හිසින් ඉවත් කොට මහාජනයාට ද ඔවා දී අතුරුදන් වූහ.

බුදුන් වහන්සේ එකලැ පුරොහිත බමුණා නම් දෙව්දත් මැ යැයි පවසා දේශනාව අවසන් කළ සේක.

(මෙකල ද දිවැස් නැති අප ඉදිරියේ ඔවුනොවුන් භේද කරවන, ඔවුනොවුන් කොටවන, ඇතැම් විට මහ සැදැහැති කම් දක්වා භික්ෂූන් පවා භේද කරනට උත්සාහ දරන, නැති ගුණ පෙන්වන, සම්මුඛ වැ එකකුත් විමුඛ වැ එකකුත් කියන කරන ආත්මාර්ථකාමී වූ පුහුසත්හු නැත්තාහු නොවෙති. මෙබන්දනට ඇති එක ම පිහිට නම් පෙර මෙන් දුදන ගරහන, සුදන පසසන දෙවියන් වත් නැතහොත් එබඳු දෙවියන්ගේ පසුබට වීමයි. එහෙයින් ගුණ බැතියෝ එක් වැ, පින් කොට එ පින් දෙවියනට ද අනුමෝදන් කොට එපින් අනුමෝ වැ සතුටු වන දෙවියනට නැවතත් කකුරු මල් සෝළුත් රැගෙන මිනිස් පියසට එන ලෙස ආරාධනා කෙරෙත්වා ! එසේ දෙවියන් නො ආවොත් මොවුනට යමපලුන් අතින් උරසක් මල් පැළඳෙනවාට කිසි දු සැකයෙක් නැති. හුදීහු අසරණයන් කෙරෙහි අනුකම්පා කෙරෙත්වා ! )

**බහුං වේ සරණං යන්ති - පබ්බතානි වනිනි ච**
**ආරාමරුක්ඛචේත්‍යානි - මනුස්සා භයතජ්ජිතා**

බියෙන් තැතිගත් මිනිස්සු පර්වත ද කැලෑ ද ආරාම ද වෘක්ෂ චෛත්‍යස්ථාන ද පිහිට කොට යෙත්.

(ධම්මපදය - බුද්ධ වග්ග)



# යොනිසෝ මනසිකාරය

**අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය වැලිගම ඤාණරතන**
**මහානායක මාහිමිපාණන් වහන්සේ විසිනි**

නුවණින් කල්පනා කිරීමට ''යොනිසෝ මනසිකාරය'' යි කියනු ලැබේ. යම් කෙනෙකුන්හට යොනිසෝ මනසිකාරයෙන් තොරවීමට සිදුවුව හොත් ඔහුට නොපැමිණිය හැකි අනතුරක් නැත. හැම කරදරයකට ම හැම දුකකට ම ඔහු භාජනවනු ඒකාන්ත ය.

යොනිසොමනසිකාරො භික්ඛවේ මහතො අත්ථාය සංවත්තති. මහණෙනි, නුවණින් මෙනෙහි කිරීම මහත් යහපත පිණිස හේතුවේ යයි තථාගතයන් වහන්සේ දේශනා කළේ යොනිසෝ මනසිකාරය උතුම් ධර්මයක් බැවිනි. යොනිසෝ මනසිකාරය යම් තරම් යහපතට හේතුවන්නේ නම් අයොනිසෝ මනසිකාරයයි කියන නුවණින් මෙනෙහි නොකිරීම ඒ තරම් ම පිරිහීමට හේතුවන කරුණකි. එබැවින් නුවණැත්තෝ අයොනිසෝ මනසිකාරයෙන් දුරුව යොනිසෝ මනසිකාරයෙහි යෙදෙති.

යොනිසො මනසිකාරය නම් උපාය මනසිකාරයයි. නිවැරැදි සිහිකිරීමයි අනිත්‍යයෙහි අනිත්‍යය වශයෙන් සිහි කිරීම ය. දුක්ඛයෙහි දුක්ඛ වශයෙන් සිහිකිරීම ය. අනාත්මයෙහි අනාත්ම වශයෙන් මෙනෙහි කිරීමය යනාදි වශයෙන් ඇති තතු හරිහැටි සලකා බැලීම මෙයට අයත් වෙයි. යමෙක් අනිත්‍යය නිත්‍ය

වශයෙන් හෝ දුක්ඛය සුඛ වශයෙන් හෝ අනාත්මය ආත්ම වශයෙන් හෝ සලකා නම් එය ''අයොනිසෝ මනසිකාරය යයි" කියනු ලැබේ.

නාහං භික්ඛවේ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නාවා කුසලා ධම්මා උප්පජ්ජන්ති. උප්පන්නාවා අකුසලා ධම්මා පරිහායන්ති. යථා ඉදං භික්ඛවේ මනසිකරොතො අනුප්පන්නාචේව කුසලා ධම්මා උපප්ජ්ජන්ති උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්ති.

මහණෙනි, මේ යොනිසොමනසිකාරය මෙන් නූපන් කුසල් ඉපදීමටත් උපන් අකුසල් පිරිහීමටත් හේතුවන අන් එක ම ධර්මයක්වත් මම නොදනිමි. මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නා වූ පින්වතාහට නූපන් කුසලයෝ ද උපදිත්. උපන් අකුසලයෝ පිරිහෙත්. මේ බුද්ධ දේශනයෙන් හොඳින් පෙනෙන කාරණයක් නම් කුසල් ඇතිවීමටත් අකුසල් නැතිවීමටත් යොනිසොමනසිකාරයට සමකල හැකි අන් එක ම ධර්මයක්වත් නැති බවයි. '' අයොනිසො මනසිකාර මූලකඤ්ච වට්ටං යොනිසො මනසිකාර මූලකඤ්ච විවට්ටං'' (පපංචසූදනි 60) යනුවෙන් සසර පැවැත්මට අයොනිසො මනසිකාරයත් විවට්ට සංඛ්‍යාත නිර්වාණය ලැබගැනුමට යොනිසොමනසිකාරයත් මුල්වන බවත් පැහැදිලි කරයි.

යම් කෙනෙකුන් කෙරෙහි අයොනිසොමනසිකාරය බලපවත්වන කල්හි අවිද්‍යාව සහ භවතණ්හාව දියුණු වනු ඇත. ඒ දෙක දියුණුවත් ම ජාති ජරා මරණාදී සංසාරික දුක් බහුලවීම ස්වභාව සිද්ධ ය. මේ යොනිසොමනසිකාරය නිසා දිය සුළියකට අසුවූවකු එහිම කර කවමින් මරුමුවට පත් කරන්නාක් මෙන් ද වහවහා වාතවේගයකින් අසුවු නැවක් නොයෙක් දෙස ගසාගෙන යන්නාක් මෙන් ද සෙක්කුවක බැඳි ගොනකු එහිම කරකැවෙන්නාක් මෙන් ද නැවත නැවතත් ජාත්‍යාදී දුක්වලට ගොදුරුවනු නොවැලැක් විය හැක්කකි.

යමෙක් යොනිසොමනසිකාරය පුරුදු කෙරේනම් හෙතෙමේ ආර්යඅෂ්ටාංගික මාර්ගය ද පුරුදු කරන්නෙකි. ඒ බව තථාගතයන් වහන්සේ යොනිසොමනසිකාර සම්පන්නස්සෙතං භික්ඛවේ භික්ඛුනො පාටිකංඛං අරියඅට්ඨංගිකංති යනුවෙන් දේශනාකළ සේක. ආර්යඅෂ්ටාංගිකමාර්ගයෙහි සම්මාදිට්ඨී නම් අංගය විජ්ජා යනුවෙන් ද හැඳින් වේ. ඒ සම්මා දිට්ඨී සංඛ්‍යාත විද්‍යාවගේ පහළවීම නිසා අවිද්‍යාව නිරුද්ධ වන්නේ ය. අවිද්‍යා නිරෝධයෙන් සංඛාර නිරෝධයත් සංඛාර නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධයත්, විඤ්ඤාණ නිරෝධයෙන් නාමරූප නිරෝධයත්, නාමරූප නිරෝධයෙන් සළායතන නිරෝධයත්, සළායතන නිරෝධයෙන් ඵස්ස නිරෝධයත්, ඵස්ස නිරෝධයෙන් වේදනා නිරෝධයත්, වේදනා නිරෝධයෙන් තණ්හා නිරෝධයත්, තණ්හා නිරෝධයෙන් උපාදාන නිරෝධයත්, උපාදාන නිරෝධයෙන් භව නිරෝධයත්, භව නිරෝධයෙන් ජාති නිරෝධයත්, ජාති නිරෝධයෙන් ජරා - මරණ -සොක -පරිදේව- දුක් - දෙම්නස් උපායාස නිරෝධයත් සිදුවී අමෘත මහා නිර්වාණ ධාතුව ප්‍රත්‍යක්ෂ කරන බව දේශනා කළ හෙයින් යොනිසෝ මනසිකාරය විවට්ටවුපනිස්ස වන සැටි නිවනට හේතුවන හැටි පැහැදිලි වේ.

ඇස, කන, නාසය, දිව, කය, මන යන කවර කවර ඉන්ද්‍රියකට හෝ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම යන අරමුණු අතරින් ඒ ඒ ද්වාරයනට අයත් අරමුණක් හමුවූ කල්හි පළමුකොට කළයුත්තේ ඒ අරමුණ ගැන නුවණින් සලකා බැලීම ය. එසේ නොකොට පුහුදුන් සත්ත්වයන් ගේ ඉන්ද්‍රියන් කැමති වන පරිදි අරමුණු කරන්නට ගියොත් එය මහා පිරිහීමට හේතුවනු ඇත. මෙය හොඳින් සලකන මහා නුවණැත්තෝ කවර තරමේ අරමුණුවලදී වුවත් යොනිසො මනසිකාරයෙන් යුතුව ක්‍රියා කරත්.

පෙර මහාතිස්ස නම් තෙර කෙනෙක් සෑගිරියෙහි විසූහ. උන්වහන්සේ උදසනක සෑගිරියෙන් නික්ම අනුරාධපුර පිඬු සිඟා වැඩම කළසේක. එවේලෙහි අනුරාධපුර වැසි එක් කුලඟනක් සැමියා සමඟ දබර වී සිය මවුපියන් වෙත යමැයි සිතා හොඳින්

ඇඳ පැලඳ මහ මඟට බැස සැගිරිය දෙසට යමින් සිටියහ. අර සංසුන්ව වඩින තෙරුන් දැක රාගනිඃශ්‍රිත අදහසින් යුතුව, ඒ තෙරුන් තමා කෙරෙන් පොළඹවා ගන්නට සිතා සිනහ පහළ කළහ. ඒ හඬ ඇසුණු තෙරණුවෝ මේ කිමදැයි හිස ඔසවා බැලූහ. එවිට උන්වහන්සේට දක්නට ලැබුණේ ඇය සිනාසීමට විරිත්තා ගත් දත් පෙළයි. එය දකුත්ම තමන්වහන්සේ විසින් එවකට වඩමින් හුන් ''අට්ඨික කම්මට්ඨානය'' සිතට එළැඹියේ ය. එවිට ඒ සිටිවනින් ම සිට තෙරණුවෝ ඒ අනුව පඤ්චස්කන්ධය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් සලකමින් විදසුන් සෝවාන් ආදී මහාපිළිවෙතින් රහත් වූහ. ඉන්පසු ඇගේ සැමියා ඇය සොයමින් එන්නේ තෙරුන් දැක, ස්වාමීනි ! මේ මඟින් ගැහැණියක ගියා දක්නාදැ යි ඇසී ය. එවිට තෙරණුවෝ

''නාභිජානාමි ඉත්ථිවා පුරිසො වා ඉතොගතා

අපිච අට්ඨී සංඝොසො ගච්ඡතේ ස මහාපථෙ''

මොබින් ගැහැණියක් ද, පුරුෂයෙක් ද යන වග මම නොදනිමි. එය කෙසේ නමුත් ඇට සැකිල්ලක් නම් මහමඟ යනවා දුටුවෙමි යි තෙරණුවෝ කීහ. මේ තෙරුන් වහන්සේ ඒ දුටුරූපය කෙරෙහි අයොනිසො මනසිකාරයෙන් යුතුව සැලකුවා නම් මහත් පිරිහීමට පත්වන්නට තිබුණි. එහෙත් උන්වහන්සේ හැමෙකක් ම නුවණින් සලකා බැලීමෙහි පුරුදුව සිටි හෙයින් සියල් කෙලෙස් නසා රහත් වන්නට සමර්ථ වූහ. සතර සෝතාපත්ති අංගයන්ගෙන් එක් අංගයක් වශයෙන් මේ යොනිසෝමනසිකාරය ද ඇතුළත්ව ඇත. පඤ්චස්කන්ධය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් සලකමින් විදර්ශනා වැඩීම යයි කියනුයේ මේ යොනිසොමනසිකාරය මිස අනෙකක් නොවේ. එබැවින් නිවන් දක්නට බලාපොරොත්තු වන්නන් විසින් හැමවිටම යොනිසොමනසිකාරය පුරුදු කළ යුතු ය.

ගුණ මිණි ආර - 10



# ඔබ ඔබට ම පහනක් වන්න

**''ගුරු සීයා'' විසිනි**

අත්තදීපා විහරථ අත්තසරණා, අනඤ්ඤසරණා '' මෙය බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රකට අවවාදයකි. එහි අදහස ''තමා තමාට පහනක් වන්න, තමාට තමා පිහිටක් කරගෙන වාසය කරන්න. වෙනත් පිහිටක් නැත.'' යන්නයි. අත්තා හි අත්තනෝ නාථෝ - තමාට පිහිට තෙමේ ම ය.'' මෙයත් එවැනි ම බුද්ධාවවාදයකි.

තමා බලාපොරොත්තු වන දියුණුව ලබාගත හැක්කේ තමාගේ ම නුවණ පෙරටු කරගත්තා වූ උත්සාහය අනුව බව බුදුරදහු දේශනා කරති. කෙනකු සතු නිවැරදි උත්සාහය, නිවැරදි වීර්යය බුදු දහමෙහි මහත් ඇගයීමකට ලක් කර ඇත. තමා ගේ උත්සාහය පසෙකට ලා අනුන් ගෙන් හෝ දෙවියන්ගෙන් හෝ සිය දියුණුව අපේක්ෂා කිරීම අලසයා ගේ ස්වභාවය යි. දෙවියන් ගේ ඇල්ම බැල්ම ලැබෙන්නේ දෙවියනට කන්නලව් කරන යාදිනි කරන අලස පුද්ගලයාට නොව අනලස් ව වීර්යයෙන් ධෛර්යයෙන් දුක් විඳ වෙහෙසෙන තැනැත්තාට බව ධර්ම සාහිත්‍යයෙහි පැහැදිලි කර ඇත. උද්‍යෝගිමත් ශ්‍රේෂ්ඨ මිනිසා ළඟට ලක්ෂ්මී හෙවත් සම්පත්තියේ දෙවඟන පැමිණෙන බව පැරැණි පඬිවරු කීහ.

නුවණැති තැනැත්තා උත්සාහ කරන්නේ අනුන්ගේ ද යහපත සලකාගෙන ය. තමා ගේ වීර්යයේ ප්‍රතිඵල නෙළා ගන්නේ තමා ම පමණක් නොව, තමා ගේ මවුපියන්, සහෝදර - සහෝදරියන්, නෑසියයන් බව හේ දකී. එ පමණක් නොව පොදු සමාජයත් රටත් එයින් ලබන යහපත් ප්‍රතිඵලය ඔහුට පෙනේ.

ඔහු ගේ උත්සාහය සහ එහි ප්‍රතිඵලය ඒ තැනැත්තාට ආස්වාදනීය වන්නේ මේ පුළුල් වූ තෘප්තිය සාක්‍ෂාත් කිරීමෙනි. තමා තමාට උපමා කොට සසඳා බලා තමාගේ කථා - ක්‍රියා - සිතිවිලි සකස් කරගත යුතු බව බුදුපියාණන් වහන්සේ පෙන්වා වදාළහ. මා මගේ ජීවිතයට ඉතා ආදරේ ය. අන් කෙනකු මගේ ජීවිතයට හිරිහැර කරනු, හිංසා පීඩා කරනු කැමති නැත. කොයි විදියේ දුකකට වත් මා කැමති වන්නේ නැත. ලොවෙහි අන් සියලු දෙනා මත් එසේ ම ය. ඔවුන් ද අනුන් කරන දුක් - පීඩා - හිංසා - හිරිහැර කැමැති වන්නේ නැත. කායික වධ බන්ධන කැමති වන්නේ නැත. මරණය කැමැති වන්නේ නැත. එසේ නම් මා අන් කිසිවකුට හෝ ජීවිත හානි, හිංසා පීඩා කිරීම ඒ කිසිවකු හෝ කැමැති වන්නේ නැත. මෙසේ නුවණින් සිතා අනුනට හිරිහැර අපකාර නොකරයි. අනුන් රකින, සනසන, අනුනට උපකාර කරන පිළිවෙත කෙරෙහි අන් අයත් උනන්දු කරවයි.

ඒ නුවණැති තැනැත්තා තමා ම උපමා කරගෙන, තමා ගේ කායික ක්‍රියාවනුත්, කථාවත් පිරිසුදු කරගනී. මෙසේ ක්‍රියා කරන පුද්ගලයා සැබැවින් ම සිල්වතෙකි. තමා තමා ට ම පහනක් කරගෙන වාසය කරන්නෙකි. එහි පුදුමය නම් ඒ පහන අනුන් ගේ ජීවිතයත් පහන් කරලීමට අතිශයින් ම සමත් වීම ය.

පුංචි ඔබත් කුඩා අවදියේ පටන් ඔබ ගේ ජීවිතයට මේ දහම් පහන එකතු කරගන්නට උත්සාහ කරන්න. ලෝකයට

ඔබ ගේ උපකාරය ඉතා අවශ්‍ය ය. ඔබ ගේ ඥානය, උගත්කම, ධනය අවශ්‍ය වන්නේ ලෝකයට සැනැසීම ලබා දෙන්නට ය. එබැවින් කිසි විටෙක වත් ආත්මාර්ථකාමී නොවන්න. පටු ආත්මාර්ථකාමී හැඟීමක් එන හැම ඇසිල්ලක ම එය පරාර්ථයෙහි දිය කර හරින්නට මතක තබා ගන්න.

තමා තමාට ම පහනක් වන දරුවා පංච ශීලය සිය දිවියේ මුදුනත ම තබාගෙන හැසිරේ. ශීලය තමා ගේ පණ මෙන් සලකා රකියි. අනුන්ට උපකාරයක් කරන්නේ කොයි වේලේ ද යි බලමින් හැසිරේ. සිරිසඟබෝ රජතුමා, ''මේ කුණු වී දිරා යන ශරීරය ලෝකයාගේ හිත සුව පිණිස ම දරමි''යි කියූ වීර වචනය ඒ හොඳ දරුවා නිතර කල්පනා කරයි. පරෝපකාරී අදහස්වලින් පිරුණු ඒ බෝසත් දරුවා හැම දෙනාට ම සැනසිල්ලක් වෙයි.

ගෙදර දී මවට පියාට කීකරු ව, ගෙදර කටයුතුවලට සහාය වන හෙතෙමේ පාසලේ දී ගුරුවරුනට ද උපකාර වෙයි. පාසලේ පන්තියේ හැමට ම යහ ළයක් ඇතිව යහළු කම් පාන ඒ හොඳ දරුවා බෙදාහදාගෙන භුක්ති විඳින්නෙක් වෙයි. තමා ගේ දැනුම, පත් පොත් සටහන් අනෙක් යහළුවන් සමඟ නොමසුරු ව බෙදා හදාගන්නට යුහුසුළු වෙයි. 'මම' හැඟීමට වඩා 'අපි' යන හැඟීමෙන් හැම දෙනාටම ජයග්‍රහණයේ ඉලක්කය සපුරාගන්නට මං පෙත් පාදා දෙයි. මෙසේ කරන පින්වත් දරුවා සැබැවින් ම තමා තමා ම පහනක් වන්නේ ය. එ මතු නොව හේ අනුන්ට ද එළිය ලබා දෙන පහනක් ම වන්නේ ය.



# සිනහවේ අගය

**මුතු සීයා විසිනි**

මම ළඟ දී උපාධිය සමත් වූ 14,12 සහ 3 වයසැති පුතුන් තිදෙනෙකු ගේ මවකි. උපාධියට අවසාන වශයෙන් හැදෑරුවේ සමාජ විද්‍යාව විෂයයයි. සෑම මනුෂ්‍යයකු තුළ ම තිබිය යුතු යයි මා සලකන අතිශයින් ම සිත් ඇද ගන්නා ගතිගුණවලින් සමන්විත වූ කථිකාචාර්යවරියකි, අපට ඒ විෂය උගැන්වීම සඳහා පැමිණියේ. දෙසුම අවසනැ ඇය අපට දුන් පැවැරුම වූයේ 'සිනහව' යන්න යි. එයින් ඇය අදහස් කළේ, බැහැර සමාජයට පිවිස තිදෙනෙකු සමග සිනාසී ඔවුන් දක්වන ප්‍රතිචාර වාර්තා කිරීම යි.

මා ස්වභාවයෙන් ම ආචාරශීලී ය. නිතර හැම දෙනා සමග ම සිනාසෙන, කතාබහ කරන තැනැත්තියකි. ඒ නිසා මා සැළකුවේ මට ලැබුන මේ ''පැවැරුම'' රස කැවිල්ලක් සේ ය. මේ පැවැරුම ලැබී ස්වල්ප දිනකට පසු එක්තරා උදෑසනක, සැමියා හා බාල පුතණුවනුත් සමග මැක්ඩොනල්ඩ් අවුණු හලට ගියේ වෙසෙසින් පුතාට ක්‍රීඩාවට අවස්ථාවක් සලසන්නට ය.

ආහාර පංගු ඇණවීම සඳහා කවුන්ටරය ඉදිරියේ අප පෙළ ගැසී සිටින විට, හදිසියේ ම මා පිටුපසින් සිටි හැමෝ ම වගේ ඉවත් වනු මෙන් මට දැනිනි. මගේ සැමියා පවා ඉවත්වනු දිටිමි. සිටි තැනින් අඟලක් වත් නො සැලුනු මම සිදු වී ඇති අකරතැබ්බය විපරම් කිරීමට පසු පසුට හැරී බැලීමි. මා පස්සෙන් සිටිනුයේ අසරණ අහිංසකයන් දෙදෙනෙකු පමණි. ඔවුන්ගේ සිරුරු දුගඳ නාසය

පසා කර ගෙන යන තරම් ය.

මා පිටුපසින් ම සිටි තැනැත්තා දෙස ඕනෑ කමින් බැලුවෙමි. ඔහු ගේ මුහුණ සිනහවෙන් පිරී ඉතිරී යයි. 'අප පිළිගන්න යයි පවසන්නාක් මෙන් ඔහු ගේ දෙනෙත් දිව්‍යමය නීල වර්ණ ආලෝකයකින් බැබළෙයි. 'ආයුබෝවන්' යයි ඔහු තම අතේ ගුලි කර ගෙන සිටි කාසි ගණන් කරමින් ම පැවසුවේ ය. ඔහු පිටුපසින් සිටි අනෙකා මානසික ආබාධිතයෙකි. ඔහු නිල්වන් ඇසි ඇත්තා ගේ සිරුරෙහි එල්ලී ගෙන සිටියි. ඒ ඔහු ගේ ආරක්ෂකයා ය. මම මගේ දෙනෙතින් උනන්නට සැරසෙන කඳුළු බලෙන් රඳවා ගතිමි.

ඔබට අවශ්‍ය මොනවා ද යි කවුන්ටරයේ සිටි සේවිකාව ඔවුන්ගෙන් ඇසුවා ය.

නෝනා, අපට ඕනෑ කෝපි විතරයි '' එපමණයි ඔවුන් සතු මුදලින් ගත හැකි වනුයේ. අවුණු හල තුළ අසුන් ගෙන උණුසුම් වන්නට නම් ඔවුන් තවත් යමක් මිළට ගත යුතු ය. ඔවුනට අවශ්‍ය වූයේ උණුසුම් පමණි. මට එය දැනිණි. කෙතරම් දැඩි ව දැනුනේ ද මා දෑත් විහිදුවා උණුසුම දෙන්නට මෙන් නිල්වන් ඇස් ඇත්තා වැළඳ ගතිමි.

ඒ වන විටය, අවුණු හලේ සියල්ලන් ගේ ම නෙත් මා දෙස, මා කරන හැම දෙයක් ම පිරික්සමින් යොමු ව ඇති බව වැටහුණේ. මම සිනා සී තවත් පංගු දෙකක් වෙනම බන්දේසියක තබා දෙන්නට ඇණවුම් කළෙමි. එය ද රැගෙන අසරණයින් දෙදෙන විවේක ගන්නා තැනට ගිය මම එ තැන තුබූ මේසය මත බන්දේසිය තබා නිල් වන් ඇසි ඇත්තා ගේ සීතල අත මත මා අත තැබීමි. කඳුළු පිරි දෙනෙත් මා වෙත යොමු කළ ඔහු ''ඔබට ස්තුති ''යි පැවසී ය. කඳුළු පිරි නෙතින් මම සැමියා වෙත ගියෙමි. ඔහු මා කළ දෙය අනුමත කෙළේ ය.

මගේ ව්‍යාපෘති වාර්තාව ඉතා හොඳයයි පිළිගැනුනෙන් එය කණ්ඩායම ඉදිරියේ කියැවිණි.

(කෙටි කතාව)



# මලක සුවඳ

සිරි වජිරාරාමවාසී
**පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණන් විසිනි**

පින්වත් දුවේ පුතේ, ඔබට මතක ඇති සමිතට පොඩි හාමුදුරුවෝ කතාවක් කියල දෙනවා. ලෝකය ඇතිවුන හැටි මිනිසුන් ඇතිවුන හැටි ආදී කරුණු කාරණා තමයි මේ කතාවේ සඳහන් වෙන්නේ. පසුගිය කලාපයේ මිනිසුන් අතර වර්ණ භේදය ඇතිවීම ගැනත් එකිනෙකා අතර තිබුන සාමූහික බැඳීම ටිකෙන් ටික ඈත්වෙලා යන හැටිත් කියල දුන්න. අද එතැන් සිට මේ කතාව අපි අහල බලමු...................................

පොඩි මහත්තයා මතකයි නේ ද ? ස්වයං ජාත ඇල් වී ආහාරයට ගනිමින් සිටිය මිනිසුන්ව

එහෙමයි අපෙ හාමුදුරුවනේ...................මට හොඳට මතකයි.............

සුවඳැල්, බොහෝ කාලයක් කාගෙන ජීවත් වෙනකොට මේ අය තමන්ට ම කියල නිවාස ගොඩනගාගන්නට පෙළඹුනා. සමහර උදවිය විශාල ගස් බෙන නිවාස හැටියට භාවිතා කළා........

ඒත් මට නම් මේක පුදුම හිතෙන කාරණාවක්....... මිනිසුන් කොහොමද ගස් බෙනයක ජීවත් වෙන්නේ හාමුදුරුවනේ................ මෙහෙමනෙ පොඩි මහත්තයා, තම තමන්ට කියල රැකගන්න ගොඩක් දේවල් මේ අයට තිබුනෙ නැහැ. සිරුර ආරක්ෂා

කරගෙන ඉන්නයි නිවාසයක් අවශ්‍ය වුණේ........... කාලයක් ගත වෙනකොට තමයි එක එක අවශ්‍යතාවන්ට ගැලපෙන බඩු බාහිරාදිය නිවසෙ ගොඩ ගහගත්තෙ...... එතකොට තමයි නිවාස මහා විශාල වුණේ................

දවසක් එක උදාසනක මිනිසෙක් මේ සුවඳැල් හොයාගෙන ගෙදරින් පිටත් වුණා. උදෙන් ම ගියාට මොකද මෙයා බොහො ම කම්මැලි කෙනෙක්. කම්මැලිකම නම් බොහො ම ලාමක දෙයක් පොඩි මහත්තයා... මේ කම්මැලි මිනිසුන්ට කාලය වේගයෙන් ගමන් කරනවා කියල අවබෝධයක් නැහැ. ඒ නිසා ම ඔවුන් බොහො ම හෙමින් කල් මරමින් තම තමන්ට නියමිත වැඩ කරගන්නවා. එහෙම වැඩය අවසන් වුණත් සමහර විට ඒ කිසි දෙයක් සාර්ථක නැහැ. අර කතාවක් තියෙනවා "උපන්නාට මේ ලොව වැනෙනවා විනා " කියලා. ඉපදුන නිසා ජීවත් වෙනවා... එතනින් එහාට ජීවිතයේ ඉදිරි ගමනක්, දැක්මක් ගැන සිතුවිල්ලක් වත් මේ අයට ඇතිවෙන්නේ නෑ. ඇති වෙන්න අවස්ථාවකුත් නෑ..... මොකද මේ අය හැමවෙලාවේ ම අසිහියෙන් (සිහි කල්පනා නැතිව) තමයි ජීවත් වෙන්නේ........ ඒ වගේ ම හැම වෙලාවක ම උත්සාහ ගන්නේ කපටි කමින් අනුන් ලවා හරි එහෙමත් බැරි නම් වැරදි වුනත් බොහෝ ම කෙටි ක්‍රමයකින් තමන්ගේ අවශ්‍යතාව ඉටුකරගන්න. අපේ බුදුහාමුදුරුවෝ අවධාරණයෙන් " අලසො ගිහී කාම භෝගී න සාධු " යනුවෙන් රථලට්ඨී ජාතකයේ දී ත් මේ අලස කමේ ඇති භයානක කම පෙන්වලා දුන්නා. ඒ නිසා පුංචි ඔය ඇත්තො කම්මැලි කම දුරින් ම දුරු කරන්න ඕනෙ. එහෙම නැති උනොත් අවසානයේ මහා දුකකට පුංචි ඔයාව වැටෙයි. ඒ විනාශයෙන් ගලවන්න තමයි වැඩිහිටි හැමෝ ම අවවාද අනුශාසනා කරන්නෙ.

ඒ ලැබෙන අවවාද අනුශාසනා බුදු පුත් රාහුල හාමුදුරුවෝ වගේ ඉස් මුදුනින් පිළි අරගෙන ඒවාට අනුව ජීවිතය හදා ගන්න උත්සාහ කරන්න ඕන. මල් කොච්චර මේ ලෝකෙ පිපුණත් සුවඳ

පියකරු මලට තමයි හැමෝ ම කැමති. පුංචි ඔයාලත් සුවඳ හමන පියකරු මලක් වෙන්න දූන් දූන් ම අදිටන් කර ගන්න.

ඉතින් අර කම්මැලි කෙනා උදේ ම පිටත් වෙලා සුවඳුල් ටිකක් කාලා තව ටිකක් ගෙදරත් අරගෙන ආවා. ඒ මොකද නැවත නැවත සුවඳුල් හොයාගෙන යන එක මහා අමාරු වැඩක් කියල හිතුවා.

දවසකට ඇතිවෙන්න සුවඳුල් ගෙනාපු මේ කෙනා ටිකෙන් ටික දවස් දෙක තුන වශයෙන්............. බොහෝ කාලයකට සුවඳුල් රැස් කළා. ඔන්න බලන්න දූන් මේ කෙනා පොදුවේ පරිහරණයට තිබුන සොබා දහමට අයිති දේ පෞද්ගලික ව පාවිච්චියට යොමු වුණ හැටි.

හැබැයි මේ දෙය පිටින් බලාගෙන ඉන්න කාටහරි කියන්න පුලුවන් මේ ක්‍රියාදාමය කාලය කළමනාකරණය කර ගත හැකි හොඳ වැඩක් කියලා. නමුත් බලන්නකො මේ ක්‍රියාව නිසා ඉදිරියේ දී සිදුවෙන්නේ මොන වගේ දෙයක් ද කියල.

මේ පුද්ගලයාගේ ක්‍රියාව දිහා බලාගෙන හිටපු අනෙක් පිරිසත් කල්පනා කළා. මේ දෙය අපිටත් හොඳයි. අපිත් යමු ගිහින් වේල් ගණනාවකට ඇතිවෙන්න සුවඳැල් අරගෙන එමු කියල කතිකා කරගෙන බොහෝ කාලයකට ඇතිවෙන්න ස්වයං ජාත හැල් වී ගොඩ ගසා ගත්තා.

අනෙකා කළ කී දෑ අනුව යමින් එය ම යහපත් කියල හිතල පොදුවේ සැමට බෙදී යාමට තිබුන ස්වාභාවික සම්පත් තම තමන් ට කැමති ආකාරයට ගොඩ ගසා ගැනීමට මිනිසා යොමු වුණේ ඔන්න ඔය විදිහටයි.....

හාමුදුරුවනේ ඉදිරියේ දී මොන වගේ දෙයක් සිදුවෙයි ද ? සමිත ඇසුවා..........

(ලබන කලාපයට)



# Visakha

## *Chief Female Lay Disciple*

Compiled by
**Srima Warusawithana**

Born into wealth and luxury –
Visakha, daughter of Dhananjaya and Sumana,
Attained the first stage of sanctity on hearing the Dhamma,
while just a child of seven;
Her kinsmen by marriage were devotees
of the naked ascetics– the nigantas,
But with skill and unsurpassed intelligence,
Visakha led them on to hear the sublime Dhamma.
Disciplined and virtuous,
abiding by the ten-fold conduct her father bequeathed her,
Along with plentiful material wealth and a costly jeweled
ornament – the mela palandana,
Which only a fortunate maiden – endowed with beauty,
strength and virtue
Could carry with ease upon her perfectly fashioned, dainty body:
This costly ornament Visakha gifted to the
Buddha and the order of bhikkhus,
To build a mansion equipped with all the needs,
a haven of peace and quiet;

And with faith unwavering – saddha -
confidence in the Noble Triple Gem,
Gave generously - her time and wealth and ministering care.
So special were the qualities of head and heart Visakha possessed,
That at times on the Buddha’s request,
Visakha counseled the female nuns.
The day the bounteous offering of the mansion
Migara Mathu prasada (Poorvarama)
Great was the joy in Visakha’s heart, she acted like a gleeful child,
Singing the praises of the Buddha,
tracing her footsteps around the mansion,
Surrounded by her many children and grandchildren;
and they who watched this strange sight
Of stately, gracious Visakha acting like one deranged –
asked the Buddha why she acts so;
The Buddha gave reply: “ Visakha is mindful and alert,
she is truly at peace,
This is simply her expression of happiness on a noble wish fulfilled.”
The Buddha conferred upon her the unique title “Maha Upasika” –
Chief female lay disciple;
Just as a skilful garland maker from a heap of many hued,
fragrant flowers
With utmost care makes beautiful garlands,
so should one gather together
Wholesome effects – kusal, through many meritorious deeds,
wisely and timely done.